# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 22 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2006 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු.10.75 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

**2006 අංක 22 දරන ධීවර සහ ජලජ සම්පත්**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 33/2005.

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 2006 අංක 22 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1996 අංක 2 දරන පනතේ 39, 40, 41, 42 සහ 43 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 39, 40, 41, 42 සහ 43 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

"ජලජීවී වගා මෙහෙයුම්වලට බලපත්‍ර දීම.

39. (1) තත් කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ මිස, කිසිදු තැනැත්තකු විසින් ජලජීවී වගා මෙහෙයුමක් පිහිටුවීම, පවත්වාගෙන යාම හෝ මෙහෙයුමක යෙදීම නොකළ යුතු ය.

(2) ජලජීවී වගා මෙහෙයුම් සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීමට (1) උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බලාධිකාරය, 40 වන වගන්තිය යටතේ පත් කරනු ලබන යම් බලපත්‍ර දීමේ නිලධරයකු වෙත ලිඛිතව පැවරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත්තේ ය.

බලපත්‍ර දීමේ නිලධරයන් පත් කිරීම.

40. (1) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ 14අ වගන්තිය යටතේ තත් කාර්ය සඳහා නම් කරනු ලබන තැනැත්තන් අතරින්, බලපත්‍ර දීමේ නිලධරයන් වශයෙන් එක් නිලධරයකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයන් සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) උපවගන්තිය යටතේ බලපත්‍ර දීමේ නිලධරයකු වශයෙන් පත් කරනු ලැබූ නිලධරයෙක්, 39 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම නිලධරයාට ලිඛිතව පවරනු ලැබිය හැකි කාර්ය ඉටු කරනු ලැබිය යුතු ය. බලපත්‍ර දීමේ නිලධරයා සිය කාර්යයන් ඉටුකිරීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය විධානයට සහ අධීක්ෂණයට යටත් විය යුතු ය.

බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම සහ එම ඉල්ලුම් පත්‍ර පිරික්සීම.

41. (1) 39 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, ඒ ජලජීවී වගා මෙහෙයුම පිහිටුවනු ලැබීමට, පවත්වාගෙන යාමට හෝ යෙදීමට අදහස් කරනු ලබන පරිපාලන දිස්ත්‍රික්කයේ උචිත බලපත්‍ර දීමේ නිලධරයා වෙත, නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයකම අවශ්‍ය සියලු විස්තර පිළිබඳ සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු ඇතුළත් විය යුතු අතර, එම ඉල්ලුම් පත්‍රය සමඟ නියමිත ගාස්තු ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක අන්තර්ගත තොරතුරු සහ විස්තර බලපත්‍ර දීමේ නිලධරයා විසින් සළකා බැලීමෙන් පසුව සහ 39 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට ඇති යෝග්‍යතාවයට අදාළව නියම කරනු ලැබ ඇති නියමයන් ඉල්ලුම්කරු විසින් සපුරා ඇති අවස්ථාවක, ඉල්ලුම්කරුට එම බලපත්‍රය නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) ව්‍යාජ, නොමඟ යවන සුළු හෝ අසත්‍ය තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට සොයා ගනු ලබන ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයේ ආකෘතිය සහ එය බලපවත්නා කාලය.

42. 41 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක්—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරිය විමසා තීරණය කරනු ලැබිය හැකි ආකෘතියකට අනුව තිබිය යුතු ය ;

(ආ) බලපත්‍රයේ සඳහන් නියමයන් සහ කොන්දේසිවලට යටත් විය යුතු ය ;

(ඇ) බලපත්‍රයේ නිශ්චිතව සඳහන් දිනයක සිට බලාත්මක විය යුතු ය ; සහ

(ඈ) කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, ඒ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරන ලද කාලය සඳහා බලපැවැත්විය යුතු ය.

බලපත්‍රයක් අලුත් කිරීම.

43. (1) 41 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කාලය ඉකුත්වීමට පෙර දින තිහකට නොඅඩු කාලයක් තිබිය දී, තත්කාර්ය සඳහා නියමිත ආකෘතියට අනුව වූ ඉල්ලුම් පත්‍රයක්, නියමිත අලුත් කිරීමේ ගාස්තුව ද සමඟ උචිත බලපත්‍ර දීමේ නිලධරයා වෙත ඉදිරිපත් කිරීමෙන්, එම බලපත්‍රය අලුත් කරගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබීමේ දී —

(අ) නිකුත් කරන ලද බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි බලපත්‍රලාභියා විසින් කඩකර නොමැති හෝ එම නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කරමින් කිසිවක් සිදු කර නොමැති අවස්ථාවක ;

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කර නොමැති අවස්ථාවක ;

(ඇ) 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කර නොමැති අවස්ථාවක ; හෝ

(ඈ) අදාළ ජලජීවී වගා මෙහෙයුම දිගටම පවත්වාගෙන යාම මගින් පරිසරයට යම් අහිතකර බලපෑමක් සිදු නොවන අවස්ථාවක,

බලපත්‍ර දීමේ නිලධරයා විසින් බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි ය.

(3) 42 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ අලුත් කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද බලපත්‍රයක් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 43අ, 43ආ, 43ඇ, 43ඈ, 43ඉ සහ 43ඊ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 43අ, 43ආ, 43ඇ, 43ඈ, 43ඉ සහ 43ඊ වගන්ති වශයෙන් බලැපැවැත්විය යුතු ය—

"බලපත්‍රයක් අත්හිටුවීම.

43අ. (1) 41 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්—

(අ) අධිකාරිය විසින් ගනු ලබන තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් පිළිපැදිය යුතු යම් ජලජීවී වගා සංරක්ෂණ හෝ කළමනාකරණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක ;

(ආ) මේ පනත යටතේ හෝ 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ හෝ එම පනත් යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක් කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභියා චෝදනා ලැබ ඇති අවස්ථාවක ; හෝ

(ඇ) මේ පනතේ හෝ 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ යම් විධිවිධානයක් හෝ එම පනත් යටතේ සාදන ලද යම් නියෝගයක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කරනු ලැබ, එහෙත් එම උල්ලංඝනය කිරීම බලපත්‍රය අවලංගු කිරීමට තරම් දැඩි නොවන අවස්ථාවක,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම බලපත්‍රය අත්හිටුවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බලපත්‍රයක් අත්හිටුවනු ලැබූ අවස්ථාවක, එම බලපත්‍රය නිකුත් කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් ගෙවන ලද ගාස්තුවෙන් ප්‍රමාණුකූල මුදලක් ආපසු ලබා ගැනීමට එම බලපත්‍රලාභියාට හිමිකමක් ඇත.

බලපත්‍රයක් අවලංගු කිරීම.

43ආ. (1) 41 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්—

(අ) ව්‍යාජ, නොමඟ යවන සුළු හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ලබා ගෙන ඇති බවට හෙළි වන අවස්ථාවක ;

(ආ) බලපත්‍රලාභියා මේ පනත යටතේ හෝ 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක ;

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ බලපත්‍රලාභියා යම් ධීවර හෝ ජලජීවී වගා කටයුතුවලට අදාළ වරදකට වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක ;

(ඈ) බලපත්‍රලාභියා මේ පනතේ යම් විධිවිධානයක් හෝ 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ යම් විධිවිධානයක් හෝ එම පනත් යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කර ඇති අවස්ථාවක ;

(ඉ) එම බලපත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් නියමයන් හෝ කොන්දේසිවලට යටත්ව ද, එම නියමයන් හෝ කොන්දේසි කඩ කරමින් හෝ උල්ලංඝනය කරමින් බලපත්‍රලාභියා ක්‍රියාකර ඇති අවස්ථාවක ; හෝ

(ඊ) ජලජීවී වගා මෙහෙයුම දිගටම පවත්වාගෙන යාම මගින් පරිසරයට අහිතකර බලපෑමක් සිදුවන අවස්ථාවක,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ හෝ 43අ වගන්තිය යටතේ බලපත්‍රයක් අවස්ථාවෝචිත පරිදි අත්හිටුවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ අවස්ථාවක, එම අත්හිටුවීම හෝ

අවලංගු කිරීම පිළිබඳව, බලපත්‍රලාභියා විසින් ලබා දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත නිවේදනයක් මගින් බලපත්‍රලාභියා හට වහාම දැනුම්දීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

හේතු දැනුම් දිය යුතු බව.

43ඈ. අවස්ථාවෝචිත පරිදි, 41 වන වගන්තිය යටතේ හෝ 43 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එම නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද්දේ යම් බලපත්‍ර දීමේ නිලධරයකු වෙත ද, එම නිලධරයා විසින් එසේ ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු වාර්තාගත කළ යුතු ය. එසේ ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු, එම ඉල්ලුම් පත්‍රයේ දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත නිවේදනයක් මගින් ඉල්ලීම ඉදිරිපත් කළ තැනැත්තා වෙත දැනුම් දීම, බලපත්‍ර දීමේ නිලධරයාගේ කාර්යය වන්නේ ය.

අභියාචන.

43ඇ. (1) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම දැනුම් දෙමින් තමා වෙත ලිඛිත නිවේදනයක් ලැබී දින තිහක් ඇතුළත, එම තීරණයට එරෙහිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් පිළිබඳ තීරණය එම අභියාචනය ලැබී දින හැටක් ඇතුළත දිය යුතු අතර, ඒ පිළිබඳව දෙන ලද තීරණය එම අභියාචනය ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් උචිත යයි සළකනු ලබන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳව යම් තීරණයකට එළඹීමට පෙරාතුව, අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය යයි සළකනු ලබන පරීක්ෂණයක් ඔහු විසින් පවත්වනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

බලපත්‍ර දීමේ නිලධරයන්ට එරෙහිව පැමිණිලි.

43ඉ. (1) බලපත්‍ර දීමේ නිලධරයකුගේ ක්‍රියාවක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් වූ යම් තැනැත්තකුට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි අතර, එම පැමිණිල්ල පිළිබඳව උචිත යයි සළකනු ලබන සියලු ක්‍රියා මාර්ග ගැනීමෙන් අනතුරුව, එය සම්බන්ධයෙන් ගත හැකි පියවර ගැන අධිකාරිය වෙත නිර්දේශ කිරීම, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, බලපත්‍ර දීමේ නිලධරයකුට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් පැමිණිල්ලක් විභාග කිරීමෙන් පසුව සහ අවස්ථානුගත කරුණු අනුව උචිත යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සළකන අවස්ථාවක දී, එම නිලධරයා බලපත්‍ර දීමේ නිලධරයකුගේ ධුරයෙන් ඉවත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත්තේ ය.

එකතු කරන ලද ගාස්තු අධිකාරියට බැර කිරීම.

43ඊ. අවස්ථාවෝචිත පරිදි 41 වන වගන්තිය සහ 43 වන වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සහ අළුත් කිරීම සඳහා ගාස්තු වශයෙන් එකතු කර ගන්නා ලද සියලු මුදල්, මාසිකව, අධිකාරියේ අරමුදලට බැර කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියට ඉහතින් ම වූ VII වන කොටසෙහි ඇති ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :—

“ආරාවුල් සමථයට පත් කිරීම”

ප්‍රධාන ප්‍රඥප්තියට 45අ අළුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 45අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

“ජලජීවී වගා ආරාවුල්.

45අ. (1) ජලජීවී වගා මෙහෙයුමකට අදාළව යම් ආරාවුලක් පැන නැගුණ හෝ ඇති වූ බව සොයා ගනු

ලබන අවස්ථාවක, එය පරීක්ෂණය කිරීම සහ සමථයකට පත් කිරීම සඳහා ඒ වෙනුවෙන් නම් කරනු ලබන බලයලත් නිලධරයකු වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ආරාවුල යොමු කරනු ලැබිය යුතු ය. එවැනි පරීක්ෂණයක් පැවැත්වීමේ දී යම් බලපත්‍ර දීමේ නිලධරයකුගේ සහය බලයලත් නිලධරයා වෙත ලබා දිය හැකි ය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් ආරාවුලක් පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම සහ එය සමථයට පත් කිරීම සම්බන්ධයෙන් 44 වන වගන්තියේ සහ 45 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 49අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 49අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ජලජීවී වගා මෙහෙයුම්වලට අදාළ වැරදි.

49අ. (අ) වලංගු බලපත්‍රයක් නොමැතිව යම් ජලජීවී වගා මෙහෙයුමක් පවත්වාගෙන යන ;

(ආ) බලපත්‍රලාභියකු වශයෙන් සිටිමින් යම් විෂ සහිත, පීඩාකාරී හෝ හානිදායක ද්‍රව්‍යයක් හෝ දෙයක් හෝ අපවිත්‍ර ජලය යම් අභ්‍යන්තර ජලාශයකට හෝ යම් ඉඩමක පාරිසරික තත්ත්වයට අහිතකර ලෙස බලපාන ආකාරයෙන් යම් ඉඩමකට බැහැර කරන, දමන, හෝ ඉඩමක තැන්පත් කරන, මුදා හරින නැතහොත් බැහැර කිරීමට, දැමීමට, තැන්පත් කිරීමට හෝ මුදා හැරීමට අවසර දෙන ;

(ඇ) බලපත්‍රලාභියකු වශයෙන් සිටිමින් පරිසරයට හානිදායක බලපෑමක් ඇති කරවන යම් ක්‍රියාවක් සිදු කරන ;

(ඈ) යම් ජල ජීවී වගා මෙහෙයුමක් පවත්වාගෙන යමින් සිටියදී, බලපත්‍ර දීමේ නිලධරයකු විසින් නීත්‍යානුකූලව නියම

කළ විට තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ නියම කළ විට යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ව්‍යාජ, නොමඟ යවන සුළු හෝ අසත්‍ය තොරතුරු ලබා දෙන ;

(ඉ) මේ පනත යටතේ ස්වකීය කාර්යය ඉටු කරන හෝ බලතල ක්‍රියාත්මක කරන බලපත්‍ර දීමේ නිලධරයකුට බැනවැදීමේ හෝ තර්ජනය කිරීමේ වචන පාවිච්චි කරන හෝ අවමන් සහගත අභිනයක් සිදු කරන හෝ එවැනි නිලධරයකු කෙරෙහි තර්ජනය කිරීමේ ආකාරයට හැසිරෙන ;

(ඊ) මේ පනත යටතේ බලපත්‍ර දීමේ නිලධරයකු ස්වකීය කාර්යය ඉටු කරන විට එම නිලධරයාට පහර දෙන හෝ බාධා කරන ;

(උ) බලපත්‍ර දීමේ නිලධරයකු විසින් දෙනු ලබන සෑම නීත්‍යානුකූල උපදෙසකට හෝ විධානයකට වහාම සහ සම්පූර්ණයෙන් ම එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වන, ප්‍රතික්ෂේප කරන හෝ අතපසු කරන ;

(ඌ) බලපත්‍ර දීමේ නිලධරයකු ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටින හෝ එවැනි නිලධරයකු සාවද්‍ය ලෙස නියෝජනය කරන ; හෝ

(එ) ස්වකීය කාර්යය ඉටු කිරීමේ දී බලපත්‍ර දීමේ නිලධරයකුගේ කාර්යයවලට යම් ආකාරයකින් අයුතු ලෙස මැදිහත් වන,

සෑම තැනැත්තෙක්ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, මාස දහඅටකට නොඅඩු සහ මාස තිස්හයකට නොවැඩි කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත

කිරීමකට හෝ රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට, නැතහොත් එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 57අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 57අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"පනවන ලද දඩ මුදල්වලින් සියයට පනහක් අධිකාරිය වෙත බැර කරනු ලැබිය යුතු බව.

57අ. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ 49 වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කිරීම සඳහා අධිකරණයක් විසින් පනවනු ලබන සෑම දඩ මුදලකින් ම සියයට පනහක්, අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 58අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 58අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"හඳුනා ගැනීමේ සාක්ෂි ඉදිරිපත් කිරීමට බලපත්‍ර දීමේ නිලධරයන්ට නියම කරනු ලැබ ඇති බව.

58අ. (1) මේ පනත යටතේ ස්වකීය කාර්යය ඉටුකිරීමේ දී බලපත්‍ර දීමේ නිලධරයකු විසින් තමා දරන ධූරය ප්‍රකාශ කර, මේ පනතේ කාර්යය සඳහා බලපත්‍ර දීමේ නිලධරයකු ලෙස තමා පත්කරනු ලැබ ඇති බව ඔප්පු කිරීම සඳහා සාධාරණ ලෙස ප්‍රමාණවත් වන සාක්ෂි, එම බලපත්‍ර දීමේ නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) යම් බලපත්‍ර දීමේ නිලධරයකු තම ධූරය ප්‍රකාශයට පත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ තමා මේ පනත යටතේ බලපත්‍ර දීමේ නිලධරයකු ලෙස පත් කරනු ලැබ ඇති බව ඔප්පු කිරීම සඳහා සාධාරණ ලෙස ප්‍රමාණවත් වන හඳුනාගැනීමේ සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, එම බලපත්‍ර දීමේ නිලධරයා විසින් කරනු ලබන ඉල්ලීමකට, විධානයකට හෝ නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට යම් තැනැත්තකු ප්‍රතික්ෂේප කිරීම, මේ පනත යටතේ වරදක් නොවන්නේ ය.".

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ට) ඡේදය ඉවත් කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ජලජීවී" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"ජලජීවී වගාව" යන්නෙන්, මසුන් හෝ අනෙකුත් ජීවී ජලජ සම්පත් ඇති කිරීම, බෝ කිරීම හෝ වගා කිරීම අදහස් වන අතර, මෙයට බිත්තර, අණ්ඩපාත, කීටයන් හෝ බිත්තර අවස්ථාවේ සිට කෙරෙන වගාව, බෝ කිරීම හෝ ඇති කිරීම ද, නීත්‍යානුකූලව ස්වභාවික පරිසරවලින් අල්ලා ගන්නා ලද හෝ නීත්‍යානුකූලව රටතුළට ආනයනය කරන ලද මසුන් හෝ ජලජ පැලෑටි හෝ ජලජ සම්පත් ඇති කිරීම හෝ ඒ හා සමාන වෙනත් ක්‍රියාවලියන් ද, ඇතුළත් වේ ;";

(2) "ජලජීවී වගා ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් ;

(3) "ජලජ මාධ්‍ය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින් :–

"ජලජීවී වගා මෙහෙයුම්" යන්නෙන් වාණිජ කාර්යය සඳහා මසුන් ඇතුළුව ජලජ ශාඛා හෝ ජලජ ජීවීන් වගා කිරීම සඳහා පිහිටවනු ලැබූ හෝ භාවිත කරනු ලබන යම් ප්‍රදේශයක, කොරටුවක, පොකුණක, කොටුකළ ස්ථානයක, පරිශ්‍රයක හෝ ව්‍යුහයක ජලජීවී වගා පවත්වාගෙන යාම අදහස් වන අතර, මුතු බෙල්ලන් හෝ වෙනත් බෙල්ලන් ඇති කරන යම් ජලාශ පතුලක් හෝ පහුරක් හෝ මුතු බෙල්ලන් හෝ වෙනත් බෙල්ලන් වගා කිරීම සඳහා භාවිත කරනු ලබන වෙනත් ව්‍යුහයක්, ඊට ඇතුළත් වේ ;";

(4) "ජලජ සම්පත්" යන යෙදුමෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :–

"අධිකාරිය" යනුවෙන් 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අදහස් වේ ;";

(5) "මසුන්"යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :–

"මසුන්"යන්නෙන්, ජීවත්ව සිටින හෝ ජීවත් නොවන, ජලයේ වාසය කරන ඕනෑම ජලජ හෝ සමුද්‍රීය සතෙකු අදහස් වන අතර, ඊට ඔවුන්ගේ බිත්තර, පැටව්, ඇස්වටයන් සහ එම සතුන්ගේ වර්ධන අවස්ථාවන් සහ ඔවුන්ගේ කොටස් ද, එසේම එක් ස්ථානයක වාසය කරන සත්ව විශේෂවලට අයත් සියලු ජීවීන් ද ඊට ඇතුළත් වේ;"; සහ

(6) "විකිණීම" වන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :–

"එක් ස්ථානයක වාසය කරන සත්ව විශේෂ" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි, අස්වැන්න නෙලාගත හැකි අවස්ථාවේ මුහුදු පතුල හෝ ජලාශ පතුල මත හෝ යට නිශ්චලව සිටින හෝ යටිපස හෝ මුහුදු පතුල හෝ ජලාශ පතුල සමග නියත සම්බන්ධතාවයකින් තොරව චලනය විය නොහැකි සමුද්‍ර හෝ ජලජ ජීවීන් අදහස් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.